# ලංසු සඳහා ආරාධනයයි
# දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.

SPRPTA

## විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති විසින් දකුණු පළාතේ පොදු මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මහජන නියෝජිතයින්, බහුජන සංවිධාන, මගී ඉල්ලුම හා රටේ සංවර්ධන අවශ්‍යතා අනුව අධිකාරිය විසින් පරීක්ෂා කර, හඳුනාගත් මාර්ග සඳහා සාමාන්‍ය සේවා/දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපභෝගී සේවා සඳහා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර 18 ක් නිකුත් කිරීමට, යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන්, මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. විශේෂ හා සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීමේ අයිතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. ලංසු සඳහා ආරාධනා කරනු ලබන මාර්ග පහත පලකරනු ලබන අතර, සෑම සේවාවක් සඳහාම පහත ලේඛනයේ සඳහන් අනුමත ආසන ධාරිතාවයෙන් යුතු බස්රථ ඉදිරිපත් කල යුතුය. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ කැඳවීම (NCB) යටතේ සාමාන්‍ය සේවා සඳහාද, දකුණු පළාත් බලපත්‍රලාභී ධාවකයින්ට පමණක් ලංසු ඉදිරිපත් කලහැකි වන පරිදි දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපභෝගී සේවා සඳහා ද ලංසු ආරාධනා සිදු කරනු ලබයි.

- අධිකාරියේ බලපත්‍රධාරියෙක් හෝ පොරොත්තු බලපත්‍රධාරියෙක් එකී බලපත්‍රය වෙනුවට මෙම මාර්ග ලංසු ප්‍රදාන බලපත්‍රයක් ලබාගනී නම් ලබාගත හැකි සහන හා මෙම බලපත්‍ර වලට අදාලව බලපැවැත්වෙන කොන්දේසි හා නියමයන් අයදුම් පත්‍ර සමග ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛන කොන්දේසි යටතේ ඉදිරිපත් කර ඇත.
- දක්ෂිණ අධිවේගී මාර්ගයේ සුඛෝපභෝගී බලපත්‍ර සඳහා අයදුම්කල හැක්කේ අධිකාරියෙන් දැනට බලපත්‍ර ලබා ඇති ධාවකයන්ට පමණි.(සමගාමී සේවාවන්ට වන බලපෑම අවම කිරීම සඳහා)
- වෙන් වෙන් වශයෙන් එක් ලංසුවකට රු.50,000/- බැගින් ආපසු ගෙවනු ලබන ඇප මුදලක් තැන්පත් කල යුතුය.
- ලංසු සඳහා ආරාධනය කරනු ලබන සෑම මාර්ගයක් වෙනුවෙන්ම නියමිත කාලසටහන් හා ගාස්තු සටහන් සකස් කර ඇති අතර ලංසු ලේඛනය තුල අයදුම්පත්‍ර සමග කාලසටහන් විස්තර ලබා දෙනු ලැබේ.

ලංසු තැබීම මගින් ලබාදෙනු ලබන මාර්ග වල ගමනාන්ත අනෙකුත් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් සිදු කරනු නොලැබේ. මෙම මාර්ගවල මගී අවශ්‍යතාවය මත සේවා තර කිරීමේදී ශ්‍රීලංගම සමග (60% - 40%) පදනම මත අනාගතයේ සේවා තර කිරීම සිදු කෙරේ. ඒ අනුව මාර්ග පරික්ෂා කර සේවා පවත්වාගෙන යාමේ හැකියාව සලකා බලා පමණක් ලංසු වටිනාකම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි. සේවා පිළිබඳ අවබෝධයකින් තොරව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කොට ඒ මත පසුව අභියාචනා කිරීමේ අයිතියක් ඉල්ලුම්කරුට නොපවතී.

ටෙන්ඩර් හිමිකම ලබාගැනීමෙන් පසු දින 60 ක කාලය ඇතුලත බලපත්‍රය ලබාගෙන සේවාව ආරම්භ කල යුතු අතර කිසිදු හේතුවක් නිසාවෙන් කාලය දීර්ඝ කිරීමක් සිදු කරනු නොලැබේ. එහි වගකීම ආදාල පාර්ශවය විසින් දැරිය යුතුය.

### ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ග විස්තර

### ලංසු ආරාධනය 01 (දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා සුඛෝපභෝගී බලපත්‍ර)

| ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාව | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 2020/ADM/DEV/FI/03/17/01 | 32/7/EX/AC | ගාල්ල - ගමුදාව හන්දිය (පින්නදූව - මත්තල - ලුණුගම්වෙහෙර - පන්නෙගමුව - තිස්ස මහාරාමය හරහා) | 33 | 1164000.00 |
| 2020/ADM/DEV/FI/03/17/02 | 32/10/EX/AC | ගාල්ල - හම්බන්තොට - (කරාපිටිය -තලගහ - කුරුදුවත්ත - පින්නදූව - මත්තල - ගොන්නෝරුව හරහා) | 33 | 1045000.00 |
| 2020/ADM/DEV/FI/03/17/03 | 32/2/EX/AC | ගමුදාව හන්දිය - කරාපිටිය (තිස්ස මහාරාමය - පන්නෙගමුව - ලුණුගම්වෙහෙර - මත්තල - පින්නදූව - ගාල්ල හරහා) | 33 | 1164000.00 |
| 2020/ADM/DEV/FI/03/17/04 | 32/3/EX/AC | අම්බලන්ගොඩ -තිස්සමහාරාමය (හික්කඩුව - බද්දෙගම - මත්තල - ගොන්නෝරුව - හම්බන්තොට හරහා) | 33 | 689000.00 |
| 2020/ADM/DEV/FI/03/17/05 | 334/1/EX/AC | මාතර - තිස්සමහාරාමය (පාලටුව - අන්දරවැව - හම්බන්තොට හරහා) | 33 | 950000.00 |
| 2020/ADM/DEV/FI/03/17/06 | 334/1/EX/AC | තිස්සමහාරාමය - මාතර (හම්බන්තොට - අන්දරවැව - පාලටුව හරහා) | 33 | 950000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2020/ADM/DEV/FI/03/17/07 | 333/4/EX/AC | තංගල්ල - මාතර (බෙලිඅත්ත - කහවත්ත - පාලටුව හරහා) | 33 | 713000.00 |
| 2020/ADM/DEV/FI/03/17/08 | 515/3/EX/AC | වලස්මුල්ල - හම්බන්තොට (වීරකැටිය - කසාගල - අන්දරවැව හරහා) | 33 | 891000.00 |
| 2020/ADM/DEV/FI/03/17/09 | 333/3/EX/AC | බෙලිඅත්ත - හම්බන්තොට (කහවත්ත - අන්දරවැව හරහා) | 33 | 665000.00 |
| 2020/ADM/DEV/FI/03/17/10 | 17/EX/AC | සූරියවැව - කරාපිටිය (වැටිය - පින්නදූව - ගාල්ල හරහා) | 33 | 440000.00 |
| 2020/ADM/DEV/FI/03/17/11 | 32/9/EX/AC | තංගල්ල - ලබුදූව (බෙලිඅත්ත - කහවත්ත - පින්නදූව - ගාල්ල - කරාපිටිය හරහා) | 33 | 465000.00 |
| 2020/ADM/DEV/FI/03/17/12 | 353/6/EX/AC | කොටපොල - කරාපිටිය (ඌරුබොක්ක - කඹුරුපිටිය -මාතර - පාලටුව - පින්නදූව - ගාල්ල හරහා) | 33 | 499000.00 |

ලංසු ආරාධනය 02 ( සාමාන්‍ය සේවා බලපත්‍ර)

| | | | | |
|---|---|---|---|---|
| 2020/ADM/DEV/FI/03/17/13 | 569/4 | යක්කලමුල්ල - මිනුවන්දෙණිය - වාඩියවත්ත - ඉමදූව | 30 | 126000.00 |
| 2020/ADM/DEV/FI/03/17/14 | 754/1 | අවිත්තාව - ගොළුවාමුල්ල - අටකොහොට හරහා අම්බලන්ගොඩ | 30 | 84000.00 |
| 2020/ADM/DEV/FI/03/17/15 | 375/7 | කොටපොල - කොස්මෝදර - බෝදෙණිය - ගොඩකුඹුර - දෙනියාය | 30 | 104000.00 |
| 2020/ADM/DEV/FI/03/17/16 | 369/8 | අඹවිල - බානගල - අතුඇල - පිටබැද්දර | 30 | 95000.00 |
| 2020/ADM/DEV/FI/03/17/17 | 499/1 | මාතර - කඹුරුගමුව - ලැබීම | 42 | 178000.00 |
| 2020/ADM/DEV/FI/03/17/18 | 351/3 | දික්වැල්ල - හුන්නදෙණිය - රත්මලේ - දංදෙණිය - රදම්පල - රත්නාවල - හුන්නදෙණිය - දික්වැල්ල | 30 | 95000.00 |

1. අභිලාෂී ලංසුකරුවන්හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත සඳහන් එක් එක් ලංසු ආරාධනයන්හි වෙන් වෙන් වශයෙන් සඳහන් ලංසු සඳහා ආපසු ගෙවනු නොලබන රු.2,000/- ක ලංසුපත් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2020/07/10 වන දින සිට 2020/07/31 දින දක්වා කාර්යාල දිනයන් තුල පෙ.ව. 8.30 සිට ප.ව 3.00 දක්වා ධාවන අංශයෙන් මිලදී ගත හැකිය.
2. අභිලාෂී යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු හා ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුල අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදි නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.
3. ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනය 2020 අගෝස්තු මස 04 වන දින 1130 පැය වන අතර එදින 1200 ට අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයේදී කොටස් වශයෙන් ලංසු විවෘත කරනු ලැබේ.
4. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් අනුපිටපතකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් වීදිය, නො.67හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ එවීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර සිදු කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ලංසු යොමු අංකය සමග "විශේෂ සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම-2020" හා "සාමාන්‍ය සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම - 2020" යනුවෙන් ද , ලංසු යොමු අංකය ද සඳහන් කල යුතුය.
5. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා අනිවාර්යෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙනු ලැබේ. මෙම නියෝගය කඩ කරනු ලබන අයදුම්කරුවන්ගේ ලංසු අයදුම්පත විවෘත කරනු නොලැබේ. ඕනෑම ලංසුවක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මූලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් හෝ අංක : 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක 091- 2234237/091-2227074 මගින් විමසිය හැකිය.

ක්‍රිෂාලි මුතුකුමාරණ
සභාපති
ද.ප.මා.ම.ප්‍රවාහන අධිකාරිය
ගාල්ල.
2020/07/08